

# කතෘගෙන්

අප වර්ෂයක් පාසා රුපියල් දෙකෝටියකට වැඩි මුදලක් හා හාර කෝටියකට ආසන්න මුදල් ප්‍රමාණයක්ද, පිළිවෙලින්, ඇනු හා මිරිස් දිවයිනට ගෙන්වීම සඳහා වැය කරන්නෙමු.

පිටරටින් ගෙන්වන එම ඇනු කොටස් දෙකකට බෙදීමට පිළිවන. එනම් රතුඇනූ හා බොම්බායි ඇනූ වශයෙනි. අද දවස දිවයිනේ වගාවන රතුඇනූ ප්‍රමාණය අපට වුවමනා තරමට කිට්ටුව තිබේ. රතු ඇනූවලින් ලාංකිකයින් ස්වයංපෝෂිතයට ළඟාව සිටින්නේ යාපනේ අර්ධද්වීපය ප්‍රමුඛ වියලි හා ශුෂ්ක පෙදෙස්වල වගා කෙරෙන ඇනූ නිසාය. එසේ වුවද අප මෙකල රතුඇනූ සඳහා රුපියල් විසි ලක්ෂයක් පමණ පිටරට යවන්නෙමු. එසේ කිරීමට සිදුවී ඇත්තේ අවුරුද්දේ තෙමසක කාලයක් තුළදී දිවයිනේ රතුඇනූ හිඟව ඇති හෙයිනි. දෙසැම්බර්, ජනවාරි හා පෙබරවාරි මාසයන්හී යාපනේ අර්ධද්වීපයේ රතුඇනූ හිඟව ඇති සමයේ දිවයිනේ අනෙක් පෙදෙස්වලද සිරිත් වශයෙන් රතුඇනූ හිඟව තිබෙයි. එයට මුල් හේතුව, එම මාසවලදී ප්‍රයෝජනය සඳහා ගොවීහු රතුඇනූ ගබඩා කර නොතැබීමයි. නිෂ්පාදනයක් නොමැති එම මාසවලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ඊට පෙර නිපදවන රතුඇනූ හොඳාකාරව ගබඩා කර තබා ගැනීමෙන් අප රටට සම්පූර්ණ රතුඇනූ ස්වයංපෝෂිතය ලබා ගැනීමට මාර්ගය සැලසේ. මෙය ගොවීන්ගේ විශේෂ අවධානයට යොමු විය යුතු කරුණකි.

ඒ අතර ළූනු ගෙන්වීමට පිටරට ඇදී යන මුදලින් විශාල ප්‍රමාණයක් එනම් රුපියල් දහනව කෝටියක් පමණ වැය වන්නේ බොම්බායි ළූනු හා එවැනි ලොකු වර්ගවල ළූනු ගෙන්වීමටය. බොම්බායි ළූනු වගාව අප දිවයිනේ මෙතෙක් එතරම් සාර්ථකව ඉටු නොවූ කාර්‍යයකි. එසේ වුවද, මෑතක සිට මෙය වඩා විශාල උනන්දුවකින් වගාවට බලාපොරොත්තු බෝගයකි. විශාල ලෙස බොම්බායි ළූනු වගාව සඳහා සුදුසු ප්‍රදේශය වන වියලි කලාපයේ ඕනෑ තරම් ඉඩකඩ ඇත. එහි ජල සම්පාදනයක් ඇතිව මෙම ළූනු වගාවට වටිනා අනාගතයක් තිබෙන බව නොරහසකි. මිල සහතිකයක් ඇතිවිට වගාවට අවශ්‍ය බීජ සැපයෙන්නේ නම්, මෙම ගොවිතැනින් වියලි කලාපීය ගොවියාට මෙන් රටටද සෙතක් වෙනවා නිසැකයි.

රුපියල් හාර කෝටියකට ආසන්න මිලක් වටින මිරිස් ප්‍රමාණයක් අප රටට ගෙන්වා ගැනීමට සිදුවී තිබීම ඇත්ත වශයෙන්ම කණගාටුදායක කරුණකි. ඒ කුමක්දයත් වියලි මිරිස් නිෂ්පාදනය සඳහා සාර්ථකව මිරිස් වගා කළ හැකි පෙදෙස් ලංකාවේ එමට තිබෙන හෙයිනි. අප රටේ වියලි කලාපය බෙහෙවින් ඉඩකඩ ඇති භූමි කොට්ඨාශයකි. එපමණක්ද නොව වියලි කාල සීමාවේදී මිරිස් කඩා ගැනීමට හැකිවන පරිදි බෝගය වගා කිරීමෙන් මදක් තෙතමනය ඇති පෙදෙස්වල පවා වියලි මිරිස් නිෂ්පාදනයට ඉඩ කඩ තිබෙයි. එය, වියලි කලාපයේ, අහස් දියෙන් යැපෙන විට මාස් මෝසමට, ජල පහසුකම් ඇති තන්හී මහට පමා කළ බෝගයක් ලෙස හා යල් කන්නයේ ජල පහසුකම් ඇති කුඹුරුවලද සාර්ථකව වගා කළ හැකිය.

අනර්ඝ වියලි මිරිස් නිෂ්පාදනය සඳහා ඉතාම සුදුසු වර්ගය වශයෙන් සල කන්නේ තුත්තුකුඩි නමැති මිරිස් වර්ගය වුවද, මිරිස් අඩු පාඩුව පිරිමැසීමවස් දේශීය මිරිස් වර්ගය වන වන්නි මිරිස් වගාව දියුණු කිරීමට දැන් කටයුතු සැලසී තිබෙයි.

ළූනු මිරිස් දෙවර්ගයම වැඩි වැඩියෙන් වගා කර ඒවායින් ස්වයංපෝෂිතය ලබා ගැනීම සඳහා මෙම ගොවිතැනට ණය පහසුකම්, පොර හා වෙනත් ගොවි උපකරණ ලබා ගැනීමේ පහසුකම්, අලෙවි පහසුකම් හා මිල සහතික පහසුකම් යනාදි සියල්ල දැන් රජයෙන් සැපයී ඇත.

ඒ අතර රතුළූනු හා මිරිස් වගාවේ යහපත් ගොවිතැන් ක්‍රමයන් උගෙනීම සඳහා යාපනේ අර්ධද්වීපයේ ළූනු හා මිරිස් වගාව සඳහා ලියවී ඇති ලිපිය කියවීම වටී.